කඩු පහරකින් බිළිඳියක් මියයෑමේ පුවතක් මාධ්‍ය මගින් ආවරණය කර තිබිණි. එහිදී මියගිය බිළිඳියගේ මිත්තනියගේ අත ද කඩු පහරින් කැපී වෙන්වී ඇති බව ප්‍රකාශ කෙරිණි. මෙය වාර්තා කළ ඇතැම් මාධ්‍ය, එම කැපී වෙන් වූ අත් කොටසද පෙන්වන අයුරු නිරීක්ෂණය කිරීමට හැකි විණි. මෙහිදී අද දෙරණ පුවත් තුළ එම දර්ශනය බොඳ කොට දක්වා තිබිණි. හිරු ටීවී පුවත් තුළද එම දර්ශනය බොඳ කොට දක්වා තිබුණත්, එම බොඳ කිරීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ බැවින් එම කැපී වෙන්වූ අත් කොටස දැකීමේ හැකියාව තිබේ. මේ අතර දිවයින පුවත්පත, එම ඡායාරූපය කිසිදු බොඳ කිරීමකින් තොරව පළ කර තිබේ.

ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම මාර්ගෝපදේශයන්හිද දැක්වේ

.

මෙවැනි නැරඹීමට අපහසු තරමේ සංවේදී දසුනක් පළ නොකිරීම මගින් ලිපියේ/පුවත් විකාශයේ අන්තර්ගතයට හෝ ඉන් ඉදිරිපත් කරනා කාරණයට හානියක් සිදුවේ ද යන්න පාඨක/ප්‍රේක්ෂක අප නැගිය යුතු පැනයයි. එසේ හානියක් නොවන්නේ නම්, මෙවැනි සංවේදී දසුන් ඉදිරිපත් කරන්නේ මන්ද? එය මාධ්‍ය ආචාරධර්ම ඔස්සේ ගත් විටද ගැටළුකාරී නොවන්නේද?

#MediaEthicsSL #lka #SinhalaNews #Lankadeepa #Divaina #deranatv #HiruNews